# වලගම්බා රාජ්‍ය සමයට අයත් ඓතිහාසික ලෙනගල රජමහා විහාරයේ පුරාවිද්‍යාත්මක නිර්මාණ පිළිබඳ විමර්ශනයක්

එම්.ඩබ්.එල්. කරුණාරත්න[1]

කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ලෙන් විහාර අතරින් ලෙනගල රජමහා විහාරය ලෙනගල ග්‍රාමයේ පිහිටා ඇත. මෙම විහාරය වලගම්බා රජු සමයෙහි ශ්‍රී වර්ධන සතර කෝරළයට අයත් බෙලිගල කෝරලයේ කීරවැලි පත්තුවේ සල්ගල වනෝද්‍යානයෙහි විසූ ආයක දූහතර හා ආයක ශිව යන ප්‍රදේශාධිපති විසින් කටාර කොටවා ශිලාලිපියකින් සඟසතු කරවන ලදී. අද වනවිට නිධන් සොරුන්ගෙන් ග්‍රහනයට ලක් වීමත්, විනාශයට ලක්වීමට ආරම්භ වී තිබීමත් මෙම විහාරයේ දක්නට ලැබෙන මූලික ගැටළුවකි. ලිඛිත මූලාශ්‍රයවල සඳහන් ඓතිහාසික අගයන් ක්ෂේත්‍රයේ පවතින පුරාවිද්‍යාත්මක සාධක සමඟ තහවුරු කිරීමත් තුළින් මෙම විහාරය සතුව පවතින පුරාවිද්‍යාත්මක වටිනාකම හඳුනාගැනීම මෙහි මුඛ්‍ය අරමුණ වන අතර ක්ෂේත්‍ර මෙන්ම ක්ෂේත්‍ර නොවන ගවේෂණය අධ්‍යයන ක්‍රමවේද ලෙස යොදා ගැණින. අනුරාධපුර හා මහනුවර යන යුග දෙකෙහිම නිර්මාණයන්ගෙන් විහාරය සමන්විත වේ. ප්‍රධාන විහාර මන්දිරයේ ඇති මකර තොරණ කලාත්මක වූ නිර්මාණයකි. එය දේව, මානව, පක්ෂීන්, ඉරහඳ, ලියවැල්, වාමන රූපයෙන් අලංකාර වේ. මෙම විහාරයේ ගලින් නිම වූ උළුවහු තුනකි. එම උළුවහු ප්‍රධාන විහාර මන්දිරයටත්, චෛත්‍ය සහිත විහාරගෙටත් සත්සතිය සහිත ලෙන්විහාර කොටසටත්, පිවිසෙන ස්ථානවල පිහිටා ඇත. ප්‍රධාන බුදුමැදුරෙහි වැදගත් නිර්මාණ රැසකි. අඩි 29 ක් වූ වර්ණාලේපිත සැතපෙන පිළිමය පොල්කෙඳි, දහයියා වැනි ද්‍රව්‍යය යොදාගත් සාමාන්‍ය මැටිවෙන් නිර්මාණය කර තිබේ. මෙහි වියන් මෝස්තර මෙන්ම සූවිසි විවරණය සැතපෙන පිළිමයට ඉහලින් ගල්පර්වතය මත සිතුවම් කර ඇත. දඹුලු විහාරයේ දේවාරාධනාවට සමාන දේවාරාධනාවක් සැතපෙන පිළිමයට පිටුපසින් සිතුවම් කර තිබේ. පිළිමයට දකුණතින් විශ්ණු දේවරූපයක් හා රහත් රූප පෙළක් ඇඳ ඇති අතර වම්පසින් බෝධිසත්ත්ව රුව හා තවත් මූර්ති තුනකි. පිළිමයට ඉදිරිපස බිත්තියේ සිතුවම්, රහත් රූප පෙලක්, අලංකාර මල් මෝස්තරයන් ඇඳඇති අතර සමහරක් සිතුවම් මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායට අයත් සැරසිළි මෙන්ම යුරෝපීය ලක්ෂණ ද නිරූපිත බවක් පෙනේ. තවත් වැදගත් නිර්මාණයක් වන්නේ මහනුවර සම්පධායට අයත් සැරසිළි රටාවලින් යුක්ත මැටි පහණ හා නිධන් සොරුන් සොරාගෙන ඇති පාත්‍රයයි. විහාර භූමිය තුළ ශිලාමය ආසනයක් ද දක්නට ඇති අතර එහි ඉර, හඳ, ලියවැල් රටා විචිත්‍ර ගල් කණු හතරක් ද ඇත. තව ද භික්ෂූන් වහන්සේලා එකල බණ භාවනා කළ ලෙන් ආරාම මෙන්ම වළගම්බා රජු සල්ගල සිට ලෙනගල වෙත ඒමට භාවිත කළ උමං මාර්ගයේ කොටසක් ද මෙහි දක්නට ඇත. මේ අනුව විහාරය පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත වන වැදගත් උරුමයක් වේ. නිදන් සොරුන්ගේ ග්‍රහණයට නතුව ඇති මෙවැනි පුරාවිද්‍යාත්මක මෙන්ම කලාත්මක අතින් වටිනා ලෙන් විහාර ආරක්ෂා කර යුතුව පවතී.

ප්‍රමුඛ පද : නිර්මාණ, පුරාවිද්‍යාත්මක, මූර්ති, විහාරය ,සිතුවම්

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. waruni1995lasanthika@gmail.com